# විද්‍යෝදය සාහිත්‍ය සම්මාන ප්‍රදානය 2022

## වසරේ විශිෂ්ටතම පද්‍ය කාව්‍ය සංග්‍රහය

(විද්‍යෝදය සාහිත්‍ය සම්මාන ප්‍රදානය 2022හි, වසරේ විශිෂ්ටතම පද්‍ය කාව්‍ය සංග්‍රහය පිළිබඳ විනිශ්චය ඉදිරිපත් කළ අවසන් තීරකයාගේ නිරීක්ෂණ සටහන් ඇතුළත් දේශනය ආශ්‍රයෙන් සකස් කරන ලද්දකි.)

ගෞරවනීය මහා සංඝරත්නයෙන් සහ සම්භාවනීය අමුත්තන්ගෙන් අවසරයි.
ගත වූ වසරේ ප්‍රකාශිත සියයකට අධික පද්‍ය කාව්‍ය සංග්‍රහ අතුරින් අවසාන වටය සඳහා කෘති පහක් නිර්දේශ වී තිබුණා. තේමාත්මක නව්‍යතාව, කවීත්වය, ප්‍රතිනිර්මාණාත්මක තාක්ෂණ විධි, නිර්මාණාත්මක භාෂා භාවිතය යනාදි මූලික නිර්ණායක ගණනාවක් යටතේ සිදු කළ ඇගයීම් අනුව මේ කෘති අවසන් වටය සඳහා සුදුසුකම් ලබා තිබුණා.
අපගේ කෙටි සමාලෝචනයට පාදක වන්නේ එසේ අවසාන වටයට නිර්දේශ වූ එම කවි පොත් පහයි.

මෙවර අවසන් වටයට නිර්දේශ වූ කවීන් අතර සිටින ජ්‍යෝෂ්ඨතම කවියා වන්නේ එරික් ඉලයප්ආරච්චියි. සම්මානිත කවියකු වූ එරික්ගේ කවිය ඔහුටම අනන්‍ය වූ සුවිශේෂතාවලින් සන්නද්ධයි. පවත්නා සමාජ යථාර්ථය තමන්ගේ කවියට විෂය කරගන්නා ඔහු **ප්‍රොමිතියස් දූපත** නම් වූ කවි පොත සිය පළපුරුදු කවීත්වයෙන් හැඩ ගන්වා තිබුණා.

**ලිය සැව් ලිහී ගිය ගනසාමඬුලු** නම් වූ කවි පොතින් අපට හමුවන ලක්ශාන්ත අතුකෝරළද අපට සිටිනා සම්මානනීය ප්‍රතිභාපූර්ණ කවියෙක්.

නොස්ටැල්ජියානු සුන්දරත්වය කවිය වෙත කාවද්දවමින් මනරම් බස් හරඹයක නිරත වන ලක්ශාන්තගේ කවිය අනෙක් කවීන් අබිබවන තරමේ ආකෘතික වෙනස්කම්වලින්ද යුතු වෙනවා.

සිය නිරායාස කවීත්වයෙන් අත්දැකීමේ විවිධත්වය තීව්‍ර කර ගැනීමටත්, ඒකාකාරී බවින් කවිය මුදවා ගැනීමටත් ගත් උත්සාහය ලක්ශාන්තගේ කවියෙහි කැපී පෙනුණා. හිතින් ගමනක්, දුෂ්කර ඉස්කෝලේ ටීචර් ගැයූ ටීකා කවිය, අර මහ මුහුද ගැන කවියක ලියනවද, පෝදා හාදකම්, ආතුර තුරක සිතුමකි, වැරැන්ඩාවේ දී, වැසි නගරෙක සොනට් කවිය වැනි කවි පන්තීන් ආකෘතික, භාෂාත්මක හා අපූරු කාව්‍යෝක්තීන්වලින් පිරිපුන්.

කවි බස පිළිබඳව ඔහු සතු බුහුටි බව කෙසේ වුවද අත්දැකීමෙහි නව්‍යත්වය පිළිබඳ සැලකීමේදී කිසියම් ඒකාකාරී බවක් හා එකමාකාර කාව්‍ය භාෂාවක් මත යැපීමක් එහි දැකිය හැකි බව සඳහන් කළ යුතුයි.

නිර්දේශ වූ කවීන් අතර කාන්තා නියෝජනය වැඩි වීම මෙවර දකින්නට ලැබෙන සුවිශේෂ සාධනීය ලක්ෂණයක්. ඒ කිවිඳියන් අතුරින් සුරේඛා සමරසේන **වම් පියවුර** නමින් පළ කර ඇත්තේ සිය දෙවැනි කාව්‍ය සංග්‍රහය. ඇයට විශේෂයෙන් වස්තු විෂය වී තිබුණේ පවුල් සංස්ථාවෙහි අත්දැකීම් සමුදාය. ප්‍රේමය, ලිංගිකත්වය, ගරුත්වය, ප්‍රතික්ෂේප වීම, අපේක්ෂා භංගත්වය වැනි විවිධ අනුභූතීන් ඇය ස්ත්‍රීවාදී දෘෂ්ටිකෝණයෙන් අවලෝකනය කර තිබුණා.

මේ කවි කතිකාවතට **නාරි සූත්‍රය** රැගෙන එන්නීය අනුරාධා නිල්මිණිය. කාන්තාවන් 16 දෙනෙකු අප හමුවට රැගෙන එන මේ කාව්‍ය සංග්‍රහය චරිතාපදානයක් වැනියි. අනෙක් අතට ගැහැනු සිත් කියවන චාරිකාවක් බඳුයි. හිටපු අමාත්‍ය බදියුදීන්ගේ නිවසෙහි මෙහෙකාරියකව සිට මිය ගිය ඉෂාලිනී ජූඩ්ගෙන් ඇරඹෙන මේ කවි සුතුරට මහත්මා ගාන්ධිගේ බිරිඳ කස්තූර් බා, කාල් මාක්ස්ගේ බිරිඳ ජෙනී වොන්, හිට්ලර්ගේ බිරිඳ ඊවා බ්‍රවුන්, රෝහණ විජේවීරගේ බිරිඳ චිත්‍රාංගනී ප්‍රනාන්දු, වේලුපිල්ලෙයි ප්‍රභාකරන්ගේ බිරිඳ මදිවදිනි එරම්බු, පැබ්ලෝ නෙරුඩාට හමු වූ තංගම්මා, පාකිස්තාන අගමැතිනියක වූ බෙනාසීර් භූතෝද 1971දී සමූහ දූෂණයට ලක් කර මරා දැමූ ප්‍රේමවතී මනම්පේරී මෙන්ම යාපනය හමුදා බැරැක්කයක සෙබළුන් විසින් දූෂණය කර මරා දැමූ ක්‍රිෂාන්ති කුමාරස්වාමීද අයත් වෙනවා.
මේ හැම ගැහැනියකටම තරුණියකටම කියන්නට කතාවක් තියෙනවා. එහෙත් ඒ කතාව අසන්නට කාලයක් නැති ලෝකයටයි අනුරාධා ඔවුන්ගේ කතාව කියන්නේ.
උපුටා ගන්නා කැමැතියි ප්‍රංශයේ ඔත්තුකාරියක ලෙස සැලකූ පසුව මරා දැමූ මාතාහරී කවි පන්තියෙන්

කොතැනින් පටන් ගත්තත් - අන්තිමට ඔබ කැමති - දකින්නට මගෙ නිරුවත
හැබැයි මම කියන්නේ - හුභාක් ලස්සන -
නරක ගෑනුන්ගේ නිරුවතට යටින් තියෙන - හදවත
මේ කමලා දාස්ගේ හදවතේ රිදුම
නො අසන්න කවි ලිව්වෙ කොහොමදැයි ඔය තරම් මිහිරි
ඉවසන්න බැරි හුහක් දේ තිබුණෙ හැමතැනම ඉහිරී
දිවි සන්නසේ සුමට, ආවාට මතුපිටම සිහිරි
ඉවසන්න බැරි ගෑනු අත් ලිව්ව කවි තමයි මිහිරි

අනුරාධා ස්ත්‍රී ආත්මයේ ඇතුළාන්තය විනිවිද බලා කිසිවෙකුට හෝ ඇස නො ගැසුණු ස්ත්‍රී චිත්තය හෙළිදරව් කිරීමට සමත් වී තිබුණා වුණත් සංසන්දනාත්මක ඇගයීමේ දී වෙනත් කෘතියක් ඇය අබිබවන්නට සමත් වී තිබුණු බව කිව යුතුයි.

නිර්දේශිත කෘති අතුරින් අපට හමුවන අවසන් කිවිඳිය වන්නේ සඳරැසී සුදුසිංහයි. කිසිදා නිවැරදි කරගත නොහැකි වූ ඉතිහාසගත ඛේදවාචකයක් ඇය අප හමුවට රැගෙන එන්නේ **ගිනි වැදුණු පියාපත්** නමින්.

අපූර්වතම පරිකල්පනයකින් යුතු ඇගේ කාව්‍ය වියමන අප තුළ ඇති කරවන්නේ සමාව දිය නොහැකි තරමේ භාවමය කම්පනයක්. එහෙත් ඇය සිය කවිය පුරා ඒ ඉසියුම් මනෝභාවයන් රැගෙන යන්නේ ඉතා සංයමයකින්.

1981 මැයි මස 31 වැනිදා යාපනය පුස්තකාලයට ගිනි තැබීම මේ කාව්‍ය සංග්‍රහයට තේමාව වී තිබෙනවා. **ගිනි වැදුණු පියාපත්** අපට ආවර්ජනය කරවන්නේ ඒ ජාතිවාදී ගින්න පිළිබඳ මතකය.

එපමණක් නොව ඉතිහාසයේ කිසිදා නොවූ විරූ ඛේදවාචකයක අසාධාරණයට මුහුණ පෑ පොත් වෙනුවෙන් ඇය කොන්දේසි විරහිතව පෙනී සිටිනවා. මේ ගිනි ගෙන දැවෙන්නේ නව ලෝකයකට පියාඹා යන්නට හැකි වූ පියාපත් බඳු වූ පොත් සමුදායක්. ඒ පොත් ජාති, ආගම්, වර්ණ ආදි බෙදුම් රේඛාවක වර්ග වූ ඒවා නොවේ.

අහන්න මේ ගිනි දැවෙන ඒ පොත්වල සුසුම
සහෝදර පොත් හුස්ම හිර වී -ඇස් ද උඩගොස් හිරිවැටුණු කල
සිහිය නැතිවුණු නිසාවෙන් මට - ඉතිරි සිද්ධිය නිච්චි නැති විය
පාන්දර සයිලන් නලා හඬ - සමඟ මම ඇහැරිලා බැලුවා
අනේ දෙවියනි අපේ පවුලම - නිදි ඇඳේ අළුවෙලා සිටියා (42 පිටුව)
මේ පොතක දෘෂ්ටිකෝණයෙන් ලියූවක්.

එලෙස ගිනි වැදී අළු වුණේ සිලප්පදිහාරම්, මණිමේකලෛයි, සංගම් කෘති පමණක් නොවේ. රොබර්ට් නොක්ස්ගේ ලංකා ඉතිහාසයේ මුල් පිටපත, පිලිප් බයුඩියස්ගේ කෘතිවල මුල් පිටපත් ඇතුළුව ඉතා දුර්ලභ ලිපි ලේඛන රාශියක්ද එහි තිබුණා. මේ සියල්ලෙහි සුසුම් ඇය අපට අසන්නට සලස්වන්නේ අප හදවත්ද ඒ ගින්නෙන් අවුළුවමින්.

සාමා අමර සේම - කන්නගී කෝවලන් ද - සඳ කිඳුරි හා කිඳුරා ද
මිහිදන් විය - එකම දවසක - එකම තැනක - එක ගින්නක (49 පිටුව)

පත්තිනි සිලම්බුව වන් සීලප්පදිකාරම - මනිමේකලෛයි - කුණ්ඩලකේශී
වලයාබදී - සීවගසින්දාමනී - පස් පියුම් විය.

සංගම් විශ්වයේ - මහර්ඝතම වත්කම - ගිනි වැදී අළු විය
මදුරාපුරය මෙන - යාපන ගුවන්ගැබ අළු වලාකුළු පිරුණ (52 පිටුව)

අගත අනගත චතුදිශ සැමට පුද දුන් - යාපනේ වත්කම
අගති ජන මැති හිත් පෙරටුකොටගෙන - අපායක් කෙරුවාද මොහොතින් (54 පිටුව)
ඒ ගිනිගෙන දැවුණු පොත් අතරට ආනන්ද කෙන්ට්ෂ් කුමාරස්වාමිගේ අත් පිටපත් 700ක් ද ඇතුළත්. කිවිඳිය ඔහුද අප ඉදිරියට රැගෙන එනවා.

පිටුවහල් කළ දා එංගලන්තෙන් - යුදබිමට මා නොගිය වරදට
අවතැන් ව අසරණ ව හිටියද -
මගේ සිතුවිලි පොදි ගර්වයෙන් - උදම් වී උන්නාය මගේ හදවත මත.
යුදබිමක් උණුහුම් කරන්නට සේම - යුද බිමක් මකනු වස් ඉතිහාසයෙන්
පොත්ගුලකට ඇත අදිසි බලයක් - මිසයිල මල්ටි බැරල් බොල් කරන තරමට
මගේ අතකුරු රැඳුණ පොත්පත් - ගිනිගොඩට බිලි වුණත් කම් නැත
සාමයේ එක් සිනා බිඳකට - කමටහනක් වෙන්නට
අළුව ගිය පොත්ගුලකට හැකි නම් (122 -123 පිටු)

ඇය මේ මහා අවනඩුවේ වරදකරුවන් ලෙස ගින්දර සොයා ගත් හොමෝ ඉරෙක්ටස්, ග්‍රීක පුරාණෝක්තීන්වල එන ප්‍රොමිතියස්ද සාක්ෂ්‍යකරුවන් කරමින් කැඳවනවා. නාලන්දාව කළු කළ මහා දූමාරයත් සිහිපත් කරවනවා. සරායේවෝ **යුද්ධයෙන්** විනාශ වූ සරායේවෝ පුස්තකාලයත් මතකයට කැඳවනවා.
සඳරැසී 86 වැනි කවිය නම් කරන්නේ **දෙමළ පොතකට සිංහල හිතකින්** යනුවෙන්. භාෂාව නොදන්නා බැවින් කියවා ගන්න නොහැකිව අසරණ වූ ඇගේ සිත ඉන් කියවෙනවා.
පෙරළා බලමි ආදරයෙන් අතගාමි - කියවාගන්න බැරි පාපෙට හිස නවමි
ඇස් අග පිපුණු අසරණ කඳුළක් සිඹිමි - පෙර පින් කුඩු කමට සුසුමක් පිට කරමි

තුඩින් තුඩට වෙනසක් නැති කුරවිසර - ලියා තිබුණ පොත කොතනද ගීතස්වර
අකුරු අතර වෙනසක හැඩ නැතිම තැන - පියාපතකි නිල් අහසම සහෝදර

ගිනි වැදුණු පියාපත් ගොඩ නැගෙන්නේ සත්‍ය සිදුවීමක් සත්‍ය චරිත සහ සත්‍ය තොරතුරු වටා. එය පර්යේෂණාත්මක කාර්යයක්. ගවේෂණාත්මක කාව්‍ය ආඛ්‍යානයක්. මේ චනාහි පාපොච්චාරණයක්

නොවේ. හෘද සාක්ෂියේ රිදුමක්. මනුෂ්‍යත්වය පිළිබඳ කෙරෙනු **හෘදයංගම** සංවාදයක්. වරදකාරීත්වය පිළිබඳ තිගැස්මක්. අති ප්‍රබල භාවමය කම්පනයක්. සැබවින්ම පශ්චාත්තාපයක්.
වෛරයේ ගිනි සිළු වෙනුවට සඳරැසි කවියෙන් මේ දල්වන්නේ ආදරයේ පහන් සිළයි. ජාති, ආගම් පටු සීමාවලින් නොබෙදුණු සහෝදරත්වයේ සහන් එළියයි.

හෝඩි පොතට තව තව පිටු එකතු කර
නුහුරු අකුරු සිත් අහසට මුදා හැර
කියවනු පුතුනි ගෙල ඔසවා දෑස හැර
උගත්කමේ මායිම්ගම් මකයි ඉර

විදා පිල් නටන මොනරුනි උතුරුකරේ
වැඩිම ලකුණු ගෙන පියඹා වරෙව් මෙහේ
අඳුරු උපැස් හිමි ඇස් අඳුරේම මැරේ
පහන් තරු තියේ තාමත් දකුණු කරේ (154 පිටුව)
ඇගේ හෘදයාංගම සංතාපයේ කවිය කම්පනය වූ හදවතකින් නවමු ලොවකට ප්‍රාර්ථනා දල්වනවා. ලජ්ජා සහගත එකී ඓතිහාසික සිද්ධිය ගැන වේදනාවක් ඇති කරවනවා.
එකම කවියක් මිලට අරගෙන පුස්තකාලයෙ පොතක් අස්සෙන්
හැංගුවෙමි හදවතේ මුල්ලක - මනුෂ්‍යත්වයෙ විරිත හා බැඳ

මෙසේ බොහෝ කවි ලකුණුවලින් පරිපූර්ණ වූ තේමාත්මක නව්‍යත්වයෙන් හා ස්වාධීනත්වයෙන් අනෙක් සියලුම කාව්‍යාවලීන් අබිබවන තරමටම සඳරැසී සුදුසිංහගේ කාව්‍යාඛ්‍යානය පරිපූර්ණයි. ප්‍රශස්ත කවීත්වයකින් හා ප්‍රතිභාපූර්ණ නිර්මාණාත්මක පරිකල්පනයකින් සංගෘහිතයි.
එසේ හෙයින් වසරේ විශිෂ්ටතම පද්‍ය කාව්‍ය සංග්‍රහයට හිමි විද්‍යෝදය සාහිත්‍ය සම්මානය මෙවර හිමි කර ගන්නේ **විදර්ශන ප්‍රකාශන** විසින් ප්‍රකාශිත **සඳරැසී සුදුසිංහ** රචනා කළ **ගිනි වැදුණු පියාපත් පද්‍ය කාව්‍ය සංග්‍රහයයි.**

**ආචාර්ය හංසමාලා රිටිගහපොළ**
**සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය**
**මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**